[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

## II කොටස

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* 'අ' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා 'ආ' සහ 'ඉ' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

## 'අ' කොටස

### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

1. අනුරාධපුර යුගයේ බිහිවූ කලා නිර්මාණ අතර බුදු පිළිමය අද්විතීය කලා නිර්මාණයකි.
   (i) ශ්‍රී ලංකාවේ බුදුපිළිම නිර්මාණය සඳහා ලැබී ඇති ඉන්දීය කලා ආභාස **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)
   (ii) පන්කුලිය පිළිමයේ බාහිර ලක්ෂණ ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)
   (iii) 'මහඉලුප්පල්ලම පිළිමය' හා 'අවුකන පිළිමය' අතර පවත්නා සමානතාව, ඉරියව්ව, මාධ්‍ය භාවිතය, මුද්‍රා හා ආභාසය ඇසුරින් තුලනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 8 යි.)

2. ශ්‍රී ලංකාවේ පැවති සම්භාව්‍ය චිත්‍ර කලාව වෙනුවට 18 වන සියවසේ දී මහනුවර චිත්‍ර සම්ප්‍රදාය ලෙස නව කලා ආරක් බිහිවූ අතර, පසුව එය පහතරට ප්‍රදේශ කරා ද පැතිර ගියේ ය.
   (i) මහනුවර යුගයේ සිල්පීන්ට පාදක වූ ශෛලීය ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)
   (ii) දඹුල්ල විහාරයේ 'අනෝතත්ත විල' සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)
   (iii) මහනුවර සම්ප්‍රදායේ පහතරට ශෛලීය අනුව චිත්‍රණය වූ මුල්කිරිගල විහාරයේ තේලපත්ත ජාතකයේ 'ශ්‍රවණේන්ද්‍රිය ආකර්ෂණය කරයි'(සංගීතකරුවන්) නම් සිතුවම හා කතළුව පූර්වාරාමයේ මහාධන සිටුවරයා කරාවේ 'සංගීතය සහ විනෝද වීම' නම් සිතුවම අතර පවතින වස්තු විෂය, අවකාශ භාවිතය, වර්ණ භාවිතය, සංරචනය පිළිබඳ සංසන්දනාත්මකව විමසන්න. (ලකුණු 8 යි.)

3. ශ්‍රී ලංකාවේ ප්‍රචලිතව පැවති කලා කර්මාන්තයක් ලෙස ලෝහ කලා නිර්මාණ සැලකිය හැකි ය.
   (i) 'මාලාතාරා' මූර්තිය නිර්මාණය කර ඇති මාධ්‍ය හා ශිල්පක්‍රමය නම් කරන්න. (ලකුණු 2 යි.)
   (ii) 'අවලෝකිතේශ්වර' බෝධිසත්ත්ව ප්‍රතිමාව ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)
   (iii) 'දැදිගම කොටවෙහෙරෙන් හමු වූ ඇත් පහන විද්‍යාත්මක සංසිද්ධියක් පදනම් කොට ගෙන නිර්මාණය වූවකි.' ඒ පිළිබඳව මාධ්‍ය භාවිතය, ආකෘතිය, තාක්ෂණික උපක්‍රමය හා නිමාව අලලා ඇගයීමක් කරන්න. (ලකුණු 8 යි.)

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## 'ආ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

**4.** මෞර්ය යුගයේ ඇරඹි බෞද්ධ කලාව ගුරුකුල කිහිපයක් ඔස්සේ වර්ධනය විය.

(i) කණිෂ්ක රාජ අවධියේ දී බෞද්ධ කලාවේ උන්නතියට දායක වූ ගුරුකුල **දෙක** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) සාරානාත් ස්ථම්භ ශීර්ෂය ගැන කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) භාරුත් හි 'ජේතවනය පිදීම' හා අමරාවතී හි 'නාලාගිරි දමනය' යන කැටයම් දෙකෙහි සිද්ධි නිරූපණය හා ශිල්පීය කුසලතා පදනම් කරගෙන සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 8 යි.)

**5.** පල්ලව කලා සම්ප්‍රදායෙන් පසුව බිහි වූ චෝල කලා සම්ප්‍රදාය තුළ වාස්තු විද්‍යාව මෙන්ම මූර්ති කලාව එකිනෙකට අනන්‍ය වූ ලක්ෂණ සහිතව වර්ධනය වී තිබේ.

(i) පල්ලව වාස්තු විද්‍යා නිර්මාණ අතර දක්නට ලැබෙන ප්‍රධාන වාස්තු විද්‍යා ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) වෙරලේ දේවාලය පිළිබඳව කෙටි කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) 'කල්‍යාණ සුන්දර' මූර්තිය පිළිබඳව අන්තර්ගතය, මාධ්‍ය, ආකෘතිය හා කලාත්මක අගය අළලා ඇගයීමක් කරන්න. (ලකුණු 8 යි.)

## 'ඉ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

**6.** 19 වැනි සියවසේ යුරෝපයේ විසූ කලාකරුවන් කළ නව අත්හදා බැලීම්, සිතුවම් කලාවේ විවිධ අනුවාද රැසක් බිහිවීමට හේතු විය.

(i) පැවැති ප්‍රංශ සැලෝනයට එරෙහිව ක්‍රියා කළ ශිල්පීන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) උපස්ථිතිවාදී කලා ව්‍යාපාරයට සමගාමීව නිර්මාණකරණයේ යෙදුණු ඔගුස්ට් රොඩෑංග් ශිල්පියාගේ 'කැලේ' (Calais) නම් සමූහ මූර්තිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) පශ්චාත් උපස්ථිතිවාදී ශිල්පියකු වූ පෝල් සෙසාන්ගේ 'ඉරි තැළුණු බිත්ති සහිත නිවස' (The house with the cracked walls) හා ඝනිකවාදී චිත්‍ර ශිල්පී ජෝසප් බ්‍රාක් ගේ 'නිවාස හා ගස්' (Houses and Trees) යන සිතුවම් දෙක පිළිබඳ සම්පිණ්ඩනය, ආකෘතිය, වර්ණ භාවිතය, නිමාව ඇසුරෙන් සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 8 යි.)

**7.** රෝමය වාස්තු විද්‍යාව හා මූර්ති කලාව අතින් ඉතා දියුණුවට පත් වූ රාජ්‍යයකි.

(i) විජයග්‍රහණ ආරුක්කු **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

(ii) 'කරකැල්ලා (Cracalla) විද්ධ මූර්තිය' (උඩුකය මූර්තිය) පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5 යි.)

(iii) රෝම වාස්තු විද්‍යාවේ සියලුම යුගයන් නියෝජනය වන පරිදි නිර්මාණය කළ ක්ලෝසියම, දැවැන්ත රඟමඩලකි. ආකෘතිය, වාස්තු විද්‍යා ලක්ෂණ භාවිතය හා නූතන තත්ත්වය ඇතුළත් විමසීමක් කරන්න. (ලකුණු 8 යි.)

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/